# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1967/57 - 2016 මැයි මස 20 වැනි සිකුරාදා - 2016.05.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙහි උපලේඛනයේ 1 වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2016 මැයි මස 21 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2016.04.01 දිනැති අංක 1960/59 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් රතු ළූනු, සුදුරු බීජ සහ මහදුරු බීජ (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0703.10.10, 0909.31,0909.32 සහ 0909.61.20) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2016 මැයි මස 21 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි අවලංගු කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 මැයි මස 20 වැනි දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


1A - PG 2960 — 507 (2016/05)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වන තීරය | | | | II වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01. | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 50 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායික මසුන් (රේගු සං. ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) | 10% හෝ කි. ග්‍රෑමයට රු. 50 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 02. | 07.03 | 0703.10.10 | රතු ළූනු | කි. ග්‍රෑමයට රු. 25 |
| 03. | 07.13 | 0713.40.11 | සම්පූර්ණ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට රු. 0.25 |
| | | 0713.40.12 | පියළිකළ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට රු. 0.25 |
| | | 0713.40.21 | සම්පූර්ණ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට රු. 0.25 |
| | | 0713.40.22 | පියළිකළ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට රු. 0.25 |
| 04. | 08.04 | 0804.10.10 | රට ඉඳි - අළුත් | කි. ග්‍රෑමයට රු. 60 |
| | | 0804.10.20 | රට ඉඳි - වියළි | කි. ග්‍රෑමයට රු. 60 |
| 05. | 09.09 | 0909.31 | සූදුරු බීජ - කුඩු නොකළ හා නොඇඹරූ | කි. ග්‍රෑමයට රු. 162 |
| | | 0909.32 | සූදුරු බීජ - කුඩුකළ හා ඇඹරූ | කි. ග්‍රෑමයට රු. 162 |
| 06. | | 0909.61.20 | මහදුරු බීජ | කි. ග්‍රෑමයට රු. 162 |

06-243

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.